සන්නස
SANNASA

# නර්තනාභිශේක 2018 කරළියට

**විශ්ව රංගායතනය මෙල්බන්හි දීප්තිමත් නර්තන පාසලකි. පසුගිය වසර 10 ක කාලය පුරාවටම විශ්ව රංගායතනයේ අධ්‍යක්ෂිකා රශිකා කුලසිංහ මහත්මියගේ ගුරුහරුකම් මැද මෙල්බන් කරළියට දායාද වූ නර්තන ශිල්පීන් සංඛ්‍යාව විශාල ය.**

විශ්ව රංගායතනය මගින් දෙවසරකට වරක් පවත්වන "විශ්ව නර්ථන රේඛා" ප්‍රසංග මාලාවේ හත් වන ප්‍රසංගය "නර්තනාභිශේක 2018" කරළියට නංවන්නට රශිකා මහත්මිය දූ දරුවන් සමග දෙමාපියන්ගේද සහ යෝගය ඇතිව මේ දිනවල සූදානම් වෙයි.





කවදත් මෙල්බන් ප්‍රේක්ෂක අපට උසස් රසවින්දනයෙන් යුත් ප්‍රසංග තිළිණ කරන ඈ මෙවර ඇගේ ජ්‍යෙෂ්ඨ සිසුවිය න් පස්දෙනකු වන රවීනා දිමිති කසුනි ජනනි සහ සනාරා යන නර්තන ශිල්පිණියන් ප්‍රධාන කොටගෙන 2018

සැප්තැම්බර් 9 ඉරුදින සවස හයට නරේ වරන් Bungil Place තියටර් හිදී වේදිකා ගත කරයි.

මේ නර්තන ශිල්පිණියන් පස් දෙනාගේ කළ එළි මංගල්‍යයද මේ ප්‍රසංගයේදී නැරඹිය හැකි වනු ඇත.

ප්‍රසංගයේ හා කළඑළි මංගල්‍යයේ සියලුම වැඩකටයුතු සඳහා නොමඳව සහය දෙන විශ්ව රංගායතනයේ සියලුම දූ දරුවන්ටත් දෙමාපියන්ටත් අනුග්‍රාහක භවතුන්ටත් රශිකා ස්තුති කරයි.



මේ ප්‍රසංගයට අනුබද්ධව රවීනා දිමිති කසුනි ජනනි සහ සනාරා දියනියන් පස්දෙනාගේ කළඑළි මංගල්‍යය අගෝස්තු මස 26 වන දා ඉරිදා උදෑසන 8 සිට ප්‍රවීණ

නර්තනාචාර්ය චන්ද්‍රලාල් ජයමහ මහතාගේ මෙහෙයවීමෙන් කීස්බරෝ ධම්මසරණ විහාරස්ථාන යේදී පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇති අතර මෙම විරල අවස්ථාව දැක බලා ගැනීමට පැමිණෙන ලෙසද මෙල්බන්වාසී හිතවතුන්ට නර්තනාචාර්ය රශිකා කුලසිංහ මහත්මියත් දෙමාපියනුත් ආරාධනා කරති.






# ඔසී රටේ අපේ කතා

ඕස්ට්‍රේලියාවේ වෙසෙන සංක්‍රමණික සිංහල ලේඛකයින් විසින් තම සංක්‍රමණික අත්දැකීම් අනුසාරයෙන් රචනා කරන ලද කෙටිකතා විසිතුනකින් සමන්විත ,ඔසී රටේ අපේ කතා, ග්‍රන්ථය දැන් සරසවි ප්‍රකාශනයක් ලෙස නිකුත් වී ඇත.

**මේ ග්‍රන්ථයේ ඇතුළත් කෙටිකතා සහ ඒවායේ රචකයින් මෙසේ ය.**

- **රමේෂ්** ප්‍රියන්ත ෆොන්සේකා
- **මානව හිතවාදියා** සමන් දිසානායක
- **පුත්‍ර ස්නේහය** දීපිකා ශ්‍රියානි සුන්ද්‍රාවඩුගේ
- **මීනා** පුෂ්පා සූරියආරච්චි
- **කතුර** නිහාල් රූපසිංහ
- **අවුරුදු නැකත** පාලිත ගනේවත්ත
- **ඩොලර් දෙකේ සන්තෝෂය** රසික සූරියආරච්චි
- **දෛවයෝගයක්** ඥානතිලක හේවාගමගේ
- **වාසනාවන්තයෝ** ෂෙල්ටන් පීරිස්
- **සිඳුණු පියාපත්** ෂාමලින් පෙරේරා
- **සුරතල්ලු** ශ්‍යාමා රත්නායක
- **රියදුරු බලපත්‍රය** මොරගොඩ මලියසේන
- **දරු මුණුපුරෝ** රෝස් ගුණසේකර
- **මිණි කැට සහ මුතු ඇට** ජයන්ත අඈපා
- **ඔස්ට්‍රේලියාව, 'රටගාය' හා අප** දිලිනි ඊරියවල
- **මෝන් සහ ඩුන්** මලී දිසානායක
- **අයි කේම් ෆ්‍රොම් ශ්‍රී ලංකා** දුමින්ද ගමගේ
- **ඉරණම** උපේකා පීරිස්
- **ජන්මාන්තර වෛරක්කාරයා** රසෝමි මුදලිගේ (පරිවර්තනය නිහාල් රූපසිංහ)
- **සිනහව අතරින්** පියසේන පියසිරි
- **චෙරි** පූර්ණිමා ජයතිස්ස
- **ජීවයට ජීවය** කරුණාසේන කහටපිටිය
- **උපැස් යුවළක් අතරින්** ලලිත් ලොකුකුරුප්පුආරච්චි

ජනගත කිරීම 2018 අගෝස්තු මස 17 වන සිකුරාදා සවස 3.00 සිට 6.00 දක්වා කොළඹ විශ්ව විද්‍යාලයේ කලා පීඨයේ මහාචාර්ය එම්. බී. ආරියපාල ශ්‍රවණාගාරයේදී

**වැඩසටහණ මෙහෙයවීම,**
- කැළණිය විශ්වවිද්‍යාලයේ දර්ශන අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථාකාචාර්ය සංජීවනී මහත්මිය
- ඩයස්පෝරා සාහිත්‍ය විමසමින් කෘතිය හඳුන්වා දීම, කොළඹ විශ්වවිද්‍යාලයේ සිංහල අධ්‍යයනාංශයේ කථිකාචාර්ය අචින්ත බණ්ඩාර මහතා

**මෙම කෘතිය පිළිබඳව අදහස් පළකිරීමට නියමිත දේශකයින්**
- සම්මානලාභී ලේඛක සහ නාට්‍යවේදී පියල් කාරියවසම් මහතා
- කැලණිය විශ්වවිද්‍යාලයේ සිංහල අධ්‍යනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය චින්තක රණසිංහ මහාතා.
- ගුවන්විදුලි සංස්ථාවේ පුහුණු හා විදේශ සේවා අංශයේ අධ්‍යක්ෂ තිලිණ සමරසූරිය මහතා.




**මිල රුපියල් 450.**
සරසවි ශාඛාවන්හි විකිණීමට ඇත.